## කවි කොළය

# නීච කුලේ මහ මන්තර සාමී

හමුදාවට හෙණ රාජයෙ යන් තර
දහදාහක් දුන්නෙමි ජීවන් කර
යුද්දය දිනුවෙත් බලයෙනි මන්තර
ඒක කළේ කවුරුද වෙන මං හැර

උපා නොයෙක් යොදමින් පෙම ඉල් ලා
එපා වෙලා ගිය ප්‍රේම කුරුල් ලා
අපායෙ හිටියත් බෙල්ලෙන් අල් ලා
දෙපා ළඟට දෙන්නෙමි ගෙනැවිල් ලා

ඉනා බෙහෙත කෑ කුමරුන් සාලිය
රජ සැප හැර බැඳගති හුල වාලිය
නීච කුලේ ඒ මන්තර ජේලිය
මා ළඟ ඇත ජප කළ තෙල් බූලිය

කොණ්ඩදෙනියෙ බඩු නැත වරදින් නේ
උණ්ඩ වගෙයි කිරිගහට වදින් නේ
අණ්ඩපාල පැජරෝවෙනි යන් නේ
කොණ්ඩය බා කලු රෙදිලූ අඳින් නේ

පිරිසිදු බුදුදහමට කර ඔච්චං
ඉර හඳ තරු ගෙන කන අය පුච්චං
දෙවියන්ටත් දී පඬුරක් සොච්චං
පවසති " බුද්ධං සරණං ගච්චං"

ගුරු මැණියො ගුරු සාමිලා අප්පුලා
රොඩී රැහේ මහ මන්තර පප්පලා
පත් පිටු පුරවති අඬුපඬු පුප්පලා
ටීවී එක දෙයි ඒක උලුප්පලා

වල්ලිය කීවේ ගැහැණු සතා ටය
පිල්ලිය ඒකිගෙ පිරිමි එකා ටය
සල්ලිය ගුරුකම් කරන යකා ටය
මොල්ලිය මිනිසුන්ටත් ඇති පාටය

අවුරුදු ගණනක් කෙරුවත් වීරිය
දරු පල නැති තැන අඹු සැමි ගෝරිය
සාමිට පැවරූ විට පිය බාරිය
එතුමා සපුරා දෙයි ඒ කාරිය

උඩුකය සෙලුවට රන්දම් පොරවා
තිසුලවියක් අරගෙන හක පුරවා
අණවින කොඩි වින දොස් මග හරවා
තැපෑලෙනුත් දෙයි ගුරුකම් කරවා

බිරියයි පැටියයි මන්තිරි වස්සයි
සාමිගෙ පා දෙක ළඟ දණ ගස්සයි
සේවයෙ හැටියට ගානත් උස්සයි
රුපියල් නමසීයයි ශත විස්සයි



" ශත විස්සක් මොකටද? "
මං ඇහුවා
" දෙවියන්ටයි " කියමින්
මට රැව්වා
ඉන්පසු යටි ගිරියෙන්
කෑගැහුවා
"එළියට පල" කියමින්
දොර වැහුවා

♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



## කුරුණෑගල පාසැල් ළමයින්ට Internet Café තහනම්!

කුරුණෑගල ප්‍රදේශයේ වයස අවුරුදු 18 ට අඩු සෑම ළමයෙකුටම ඉන්ටර්නෙට් කැෆේ වලට ඇතුල්වීම සම්පූර්ණයෙන්ම තහනම්කර තිබේ. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වාස් ගුණවර්ධන මහතාගේ උපදෙස් මත පොලීසිය එම තහනම ක්‍රියාත්මකකර ඇත. එම වයස් සීමාව තුළ සිටින ළමයි ඉන්ටනෙට් කැෆේ වලට ඇතුල්වීමට අවශ්‍ය නම් ඔහු හෝ ඇයට අධ්‍යාපනය හදාරන පාසැලේ විදුහල්පතිවරයාගෙන් ලබාගත් ලියුමක් තිබිය යුතුය. පාසැල් නොයන ළමයි මව හෝ පියා සමග එම ස්ථානයට ඇතුල්විය යුතු වන්නේය. මෙම නීතියට පටහැනිව 18 ට අඩු කිසිම ළමයෙකුට ඒ ස්ථාන අසළ ගැවසීමටවත් ඉඩ නොදිය යුතුයයි ඉන්ටර්නෙට් කැෆේ අයිතිකරුවන්ට පොලීසිය දැනුම් දී ඇත.

පාසැල් ළමුන් ඇතුළු බාලවයස්කාර තරුණ ළමයි අපචාර අසභ්‍ය වැඩවලට යොමුවීම වැළැක්වීම පිණිස පොලීසිය එම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරගෙන යයි. ඊට අමතරව ඇතුගල, වැවරවුම, මල්වත්ත, බස්නැවතුම් පොළ, සුපිරි වෙළඳ සංකීර්ණය ආදී තැන්වලද තරුණ පිරිස් වලට නිකරුණේ හැසිරීමේ ඉඩකඩ අහුරා ඇත.

පොලීසිය කුරුණෑගල අවට එවැනි ස්ථාන අසළ ගැවසෙමින් එසේ නිකරුනේ ගැවසෙමින් සිටින පිරිස් ගැන සොයාබලයි. තවද සති අන්තයට කුරුණෑගල නගරය හා ඒ අවට පැවැත්වෙන ටියුෂන් පංති වලට සහභා ගිවීමට විසි දහසක් පමණ පිරිසක් පැමිණෙති. එම සිසු සිසුවියන් අතර අනුරාධපුර, පොළොන්නරුව, මැදවච්චිය, ත්‍රිකුණාමළය ඇතුළු දුර පළාත් වල අය බස්පොළට පැමිණීම වලක්වාලීම පිණිස ඔවුන් සඳහා විශේෂ බස් රථ සේවාවක් ටියුෂන් පන්ති ඇරෙන වේලාවට ක්‍රියාත්මක වෙයි.

පොලීසිය, පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගමය හා කළ සාකච්ඡාවකින් පසු එම විශේෂ බස්රථ සේවාව ක්‍රියාත්මක වෙයි. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වාස් ගුණවර්ධන මහතාගේ අධීක්ෂණය යටතේ කුරුණෑගල මූලස්ථාන පොලීසිය, රථවාහන පොලීසිය හා සෙසු පොලීසිද එක්වී-මෙන් මෙම වැඩපිළිවෙළ දියත්කර ඇත.

♦ කේ. එල්. කරුණාරත්න Sri Lanka

## Time Mag depicts Islam Brutality

A shocking portrait of an Afghan woman whose ears and nose were sliced off by her husband as punishment for leaving him, taken by Jodi Bieber for Time magazine, won the top World Press Photo prize on Friday.

Bibi Aisha, an 18-year-old woman from Oruzgan province in Afghanistan, left her husband complaining of domestic violence. A Taliban commander ordered that she face justice and her husband cut off her nose and ears. She now lives in the United States where she had reconstructive surgery.

"It's an incredibly strong image. It sends out an enormously powerful message to the world, about the 50 percent of the population that are women, so many of whom still live in miserable conditions, suffering violence. It is strong because the woman looks so dignified, iconic, though she suffered due to cruelty in Islam teachings " said Ruth Eichhorn, one of the judges, in a statement.



## ගැහැණුන්ට දෙන ඉස්ලාම් වධහිංසා

ඇමරිකාවේ ටෛම් සඟරාවේ මුල්පිටේ පළවූ නහය සහ කන්දෙක කපා දැමූ මුස්ලිම් තරුණියකගේ මේ පින්තූරයට ජාත්‍යන්තර සම්මානයක් හිමිවිය. ඡායාරූප ශිල්පිනියගේ නම ජෝඩි බයිබර්ය.

බිබී අයෙෂා නම් මේ ඇෆ්ගනිස්ථානු විවාහක තරුණිය සැමියාගේ තාඩනපීඩන ඉවසනු නොහැකි තැන ඔහු අත්හැර ගියාය. තලේබාන් නායකයා ඇයට දඬුවම් පිණිස ඇගේ සැමියා ලවා ඇගේ නාසය හා කන්දෙකම සම්පූර්ණයෙන් කපා දැම්මෙව්වේය.

ටයිම් සඟරාවේ උදව් ඇතිව ඇය දැන් ඇමරිකාවේ සැත්කම් රෝහලක නාසය සහ කන් කෘතිම ලෙස සාදාගැන්මට මහන්සි ගනී. කාන්තාවන් විඳින වධහිංසා ගැන ලොවට හඬගා කියන්නට මෙයට වඩා තවත් උදාහරණ තිබේ ද?




**ඉරිදා- SUN** බංගලාදේශයෙ දේපළ අයිතිවීමේදි ගැහැණුන්ට ලැබෙන්නෙ පිරිමින්ට හම්බවෙන දෙයින් බාගයයි. ඒ නිසා එහේ රජය මෑත නීතියක් ගෙනාව ගැහැණු පිරිමි දෙගොල්ලන්ටම සම අයිතිවාසිකම් දිය යුතුයි කියලා. ඊට විරුද්ධව එහේ මුස්ලිම් පිරිමි විරෝධතා පෙළපාලි. සමතැන් දෙන්න එපා ඔය ගෑණුන්ට මොන සමතැන්ද කියලා. පොලීසියයි හමුදා එක්ක සටටන. දෙන්නෙක් මැරිලා. තව හුඟකට තුවාලයි. ඒ මුස්ලිම් රටවල ගෑනුන්ට සලකන්නෙ අන්ත අමානුෂික විදියට. නිකම් තිරිසනුන්ට සලකනවා වගේ. සවුදි අරාබියාවට වැඩට ගිය අපේ ගෑණු උදවියට වෙන දේ අපි හොඳට දන්නවා නේ. එහේ තියෙන්නෙ මහා අධම කැත ලෝකයක්.

**සඳුදා- MON** ශ්‍රීලංකා නිදහස් පක්ෂය ඇතුළු ශ්‍රීලංකාවෙ තියන සෑම පක්ෂයක්ම එක හඬින් ජනාධිපතිවරයගෙන් අහන ප්‍රශ්නයක් තමයි " ඇයි ඔබතුමා මේ මර්වින් සිල්වය කියන ඇමතිට කනට දෙකක් ගහලා..... තෝ පල යන්න යන දේවාලෙක කියලා.....එළවලා දාන්නෙ නැත් තෙ.....? " කියලා. රජය කරන හුඟාක් සංවර්ධන වැඩ කටයුතු කඩාකප්පල් කරන්නෙ මෑන් බව දැන් ඔප්පු වෙලා තියනවා. කොළඹ, කැළණියෙ, වත්තල, පෑලියගොඩ, කිරිබත්ගොඩ ආදී ඔය ඕනම තැනක කලබලයක්, විනාසයක් වුනොත් ඒ පිටිපස්සෙ ඉන්නෙ මර්වින් සිල්වා. ඒ එක්කම කාටවත් නොතේරෙන තව එක දෙයක් තමයි, මෙච්චර දේවල් කරද්දිත් රාජපක්ෂ පවුල ඇයි කට පියාගෙන මර්වින් ට බයේ ඉන්නෙ කියලා.

**කුජදා - TUE** දැන් ලංකාවට ගිය ඕනම කෙනෙකුට ටක්ගාලා පේන දෙයක් තමයි මුලු කොළඹම හරි පිරිසිදු බව. දැනට අවුරුදු කීපෙකට ඉස්සර තිබ්ච්ච අවලස්සනකම ගිහිල්ලා. පාරවල් වල ඇවිදින්න ඕන තරම් ඉඩකඩ තියෙනවා. කුණු දාන්න තහනම්. දැම්මොත් එවලෙම දඩගහනවා නඩුදානවා. ටික ටික හරි අගනුවර යන්නෙ හොඳ පැත්තට. හැම දේටම ආණ්ඩුවට බනින යූඇන්පී අය පවා මේ වැඩපිළිවෙල ගැන හොඳ කියනවා. මේ හැම දේකම ක්‍රෙඩිට්එක සම්මානය දියයුත්තෙ කොළඹ නගරය දියුණු හා ලස්සන කරන වැඩපිළිවෙළ ආරම්භ කළ ආරක්ෂක ලේකම් ගෝඨාභයට.

**බුදදා - WED** ගෝඨාභයගෙ උපදෙස් පිට කොළඹ පිටකොටුවෙ තිබුණු පරණ මාළුකඩේ කිරිබත්ගොඩ අලුත් තැනකට ගෙනිච්චා. එතන අළුත්ම බිල්ඩිමක්. නවීන යන්ත්‍ර සූත්‍ර අයිස් පෙට්ටි ආදී හැමදේකින්ම අංග සම්පූර්ණ මාළු මාර්කට් එකක්. පිටකොටුවෙ තිබුණු කුණු ගඳ ගහන අපාය වගේ නෙවෙයි. කැත නැතුව කියන්න පුළුවන් හොඳ මාළුකඩයක් කියලා. රුපියල් මිලියනයකට වඩා වියදම ගියා කියලා කියනවා. ඒ මාළුකඩේ විවෘත කළේ ජනාධිපතිතුමා. මාළුකඩේ ඇරපු දාට පස්සෙන්දම මර්වින් සිල්වගෙ ගෝලබාලයො ආවා මාළු වෙලෙන්දන්ගෙන් කප්පම් ඉල්ලන්න. එතන ගහගෙන කඩුවලින් කපාගෙන අන්තිමේ ඒ අවුල් බේරන්න පොලීසියට බැරුව හමුදාවත් ගෙන්නුවා. ඔන්න මර්වින්ගෙ වැඩ.

**ගුරුදා - THU** ලිබියාවෙ ගඩාෆි එළවන්න හිතාගෙන ඇමරිකාව ඒ රටේ ගඩාෆිට විරුද්ධ කල්ලි වලට ආයුධ දුන්නා. දැන් ඇමරිකාවම කියනවා ඒ ලිබියාවෙ ඉන්න ගඩාෆිට විරුද්ධ කස්ටිය අල්කයිඩාවට සම්බන්ධ අය කියලා. ඔබාමා ටක්ගාලා ආයුධදීම නැවැත්තුවා. මුලින් ගඩාෆිට විරුද්ධව කෑගහපු එංගලන්තෙත් දැන් සද්ද නැතුව ඉන්නවා. කාටත් දැන් තේරිලා ලිබියාවට අතදාපු එක මහ ගොන් වැඩක් කියලා. ප්‍රංශෙ ඉතාලිය දැනටම නාගෙන ඉන්නෙ. අන්න ලිබියාවෙ සරණාගතයො දැන් ඒ රටවල් දෙකට යනවා. බාගෙදා එංගලන්තෙටත් ඒවි. ආවොත් බාරගන්න වෙනවා. මේවට තමයි කියන්නෙ නිකං ඉන්න බැරුව ඉල්ලං කනවයි කියලා.

**කිවිදා- FRI** ක්‍රිකට් වර්ල්ඩ් කප් එක පැරදිච්ච්ච එක ගැන හරි හිතේ අමාරුවෙන් සෝමතුංග බාප්ප දිග විස්තරයක් ලියලා එවලා තියනවා. අපි පරදින්න හේතුව බාප්ප කියන්නෙ අපිට දෙයියන්ගෙ සපෝට් එක ලැබුණා මදිය කියලා. දෙයියො වුනත් ඉන්දියන් කාරයන්ගෙ පැත්ත අනිවාර්යෙන්ම ගන්න ඇති කියලා බාප්පා සැක හිතනවා. බාප්පා කියනවා මිනිස්සු ඉන්දියාවෙ තියන දහස් ගණන් දේවාලවල පඬුරු බැඳලා විශාල දේවල් බාරවෙලා දෙවිවරුන්ගෙන් ඉල්ලා හිටියා ලංකාව පරද්දන්න කියලා. සමහරු මැච් එක ඉවර වෙනකල් එක දිගට ගංගානම් ගඟේ බැහැලා ස්ත්‍රෝත් කියලා තියනවා. අනික ඉන්දියන්කාරයො දෙන්නෙ නියම පූජාවට්ටි. අපේ අය වගේ එක කටටත් මදි පොඩි පැපොල් කෑල්ලකුයි, මැලි වෙච්ච ඇඹිත්තන් කෙහෙල් ගෙඩියකුයි, පණුවො ගහපු අඹ කෑල්කුයි වට්ටියක තියලා දෙනව වගේ නෙවෙයි. බාප්ප කියනවා හොඳට සලකන කොට දෙවිවරුන්ට වුනත් හිතෙනවාලු ඒ පැත්තට සපෝට් කරන්න ජනතාව විතරක් නෙවෙයි ඉන්දියන් ටීම් එකේ එකේ කට්ටියත්, සෝනියා ගාන්ධි, මන්මෝහන් සිං ආදී නායකයොත් වෙනම බාරහාර වුනා කියලා ආරංචියි.